මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\46

2023.03.23

2023.03.23 දින මැතිවරණ කොමිෂන් සභාව, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් සමඟ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සම්බන්ධව දීර්ඝව සාකච්ඡා කරන ලද අතර, මතු සඳහන් යෝජනා හා අදහස් දේශපාලන පක්ෂ ලේකම්වරුන් විසින් ඉදිරිපත් කරන ලදී.

01. පවත්නා තත්ත්වය යටතේ 2023.04.25 දිනට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීමට නොහැකි බැවින් ඉදිරි නිශ්චිත දිනයක් සඳහන් කොට ඡන්ද විමසීම පැවැත්වීම කල් දැමීම;

02. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීම සම්බන්ධව නිශ්චිත දිනයක් සඳහන් නොකොට ඒ සඳහා අවශ්‍ය පහසුකම් හා පසුබිම සාක්ෂාත් වීමෙන් අනතුරුව ඡන්ද විමසීම සඳහා දින නියම කිරීම;

03. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම නියමිත දිනට පැවැත්වීමට අදාළව දැනට අධිකරණයේ පවත්නා නඩුකර මගින් දී ඇති අතුරු නියෝග අනුව ඡන්ද පැවැත්වීම කල් දැමීම පිළිබඳව නීතිමය ගැටළු පවතින බැවින් කුමන ආකාරයකට හෝ ඡන්ද විමසීම කල් නොදැමිය යුතු වේ;

04. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීම සම්බන්ධව ව්‍යවස්ථාදායකය, විධායකය සහ සෙසු පාර්ශ්ව සමඟ සාකච්ඡා කොට ඒ මගින් ඇති කරගන්නා එකඟතා මත ඡන්ද විමසීම සඳහා ඉදිරි දිනයක් තීරණය කිරීම;

මෙම සියළු කරුණු කාරණා මෙන්ම අදාළ ඡන්ද විමසීම් නීති පිළිබඳව ද අධ්‍යයනය කොට ඡන්ද විමසීම් දිනය සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව ඉදිරි කාලයේ තීරණයකට එළඹෙනු ඇත.

ඒ අනුව 2023.04.25 දිනට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ තැපැල් ඡන්ද සලකුණු කිරීම 2023.03.28, 29, 30, 31 හා 2023.04.03 දිනවල දී සිදු නොකිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇති බව මෙයින් දන්වනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්